# කැලණිය විශ්වවිද්‍යාලය

## මානවශාස්ත්‍ර පීඨය - පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
## බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව
## 2018 වර්ෂය සඳහා අයදුම්පත් කැඳවීම

**ඉහත සඳහන් පාඨමාලාව සඳහා අපේක්ෂකයින් ලියාපදිංචි කිරීම පිණිස අයදුම්පත් කැඳවීමේ කාලය දීර්ඝ කර ඇත. එබැවින් 2018-07-31 වන දින දක්වා ඇයදුම්පත් බාරගනු ලැබේ.**

මෙම පාඨමාලාව හැදෑරීමෙන් බුදුසමයේ මූලික ඉගැන්වීම්, බෞද්ධ මනෝවිද්‍යා ප්‍රවේශය, ව්‍යවහාරික බුදුසමය, ථේරවාද සහ මහායාන සම්ප්‍රදාය, මූලාශ්‍රය ප්‍රවේශය, බුදුසමය හා නූතන සමාජ ප්‍රවණතා යන විෂය ක්ෂේත්‍ර පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් ලබාදීමට අපේක්ෂිත ය. ඒ ඔස්සේ ථේරවාද බෞද්ධ මූලාශ්‍රය පදනම් කරගෙන පිරිවෙන්, දහම් පාසැල්. පාසැල් සහ වෙනත් අධ්‍යයන ආයතනයන්හි බුද්ධ ධර්මය විෂය උගන්වනු ලබන ආචාර්යවරුන්ට නූතන අධ්‍යාපන විද්‍යානුකූල පදනමක් ඔස්සේ විධිමක් ක්‍රමවේද භාවිතයෙන් ආකර්ෂණීය විෂයක් ලෙස බුද්ධ ධර්මය ඉගැන්වීමටත් එමෙන්ම බුදුදහම පිළිබඳ මූලාශ්‍රය පදනම් කරගෙන වඩා නිරවද්‍ය අවබෝධයක් ලැබීමට අපේක්ෂාවෙන් සිටින විවිධ වයස් කණ්ඩායම්වල විද්‍යාර්ථීන්ට ථේරවාද බෞද්ධ මූලාශ්‍රය හා එයින් ප්‍රකට වන විවිධ ප්‍රවණතා පිළිබඳවත් අද්‍යතන සමාජ අභියෝගවලට මුහුණදීම පිණිස බෞද්ධ ඉගැන්වීම් පාදක කරගැනීම පිළිබඳවත් අවදිකමක් ඇති කිරීමට ද අපේක්ෂිතය. **උසස් පෙළ සමත් එහෙත් විශ්ව විද්‍යාලයකට හෝ වෙනත් උසස් අධ්‍යයන ආයතනයකට ඇතුළත්ව උපාධියක් හැදෑරීමට නොහැකිව පසුවන විද්‍යාර්ථීන්ට මෙම පාඨමාලාව ඒ සඳහා පූර්ව සුදුසුකමක් වනු ඇත.**

### පාඨමාලා කාලය:

අධ්‍යයන වර්ෂ එකකි. 2018 සැප්තැම්බර් මාසයේ සිට **සෙනසුරාදා දිනවල** කැලණිය විශ්වවිද්‍යාලයීය පාලි හා බෞද්ධ අධ්‍යනාංශයේ දී මෙම පාඨමාලාව සඳහා නියමිත දේශන පැවැත්වේ.

**මාධ්‍යය:** සිංහල

### පාඨමාලා ගාස්තු :

මෙම පාඨමාලාවේ සම්පූර්ණ ගාස්තුව රු. 40000/- කි. (රුපියල් හතළිස් දහසකි). පාඨමාලා ගාස්තුව වාරික දෙකකින් ගෙවිය හැකිය. (පළමු වාරිකය රු. 25000/- ක් ද දෙවන වාරිකය රු. 15000/- ක් ද වශයෙනි.

## අයදුම් කිරීම සඳහා අවම සුදුසුකම් :

මෙම පාඨමාලාව හැදෑරීම සඳහා අවම වශයෙන් අ.පො.ස (උ/පෙළ) විෂයයන් 3 කින් සමත් වීම **හෝ** ප්‍රාචීන මධ්‍යම විභාගය සමත් වීම **හෝ** බෞද්ධ ධර්මාචාර්ය විභාගය සමත් වීම **හෝ** අ.පො.ස.උ.පෙළ විභාගයට සමාන ජාතික **හෝ** ජාත්‍යන්තර විභාගයකින් සමත්වීම **හෝ** කැලණිය විශ්වවිද්‍යාලයීය සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

## අයදුම්පත් හා අයදුම් කරන ආකාරය :

**"බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව -2018 අයදුම්පත්‍ර ගාස්තුව"** යනුවෙන් සඳහන් කොට කැලණිය විශ්වවිද්‍යාලයේ අංක **055-1001-8-0669229** දරන ගිණුමට බැර වන පරිදි මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට රු. **750/-** ක් ගෙවා ලබාගත් රිසිට්පත පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයට පැමිණ හෝ තැපැල් මගින් යොමු කිරීමෙන් පාඨමාලා අයදුම්පත හා විස්තර පත්‍රිකාව ලබා ගත හැකිය.

තැපැල් මගින් අයදුම්පත් ඉල්ලුම් කිරීමේ දී ඉල්ලුම් කරන කවරයේ වම් කෙළවරේ **"බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව‑ 2018 අයදුම්පත් ලබා ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.
මුදල් ගෙවූ අදාළ බැංකු රිසිට්පත සමග ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය ලියන ලද **රු.15/-** ක් වටිනා මුද්දර ඇලවූ "9x4" ප්‍රමාණයේ ලියුම් කවරයක්, **සම්බන්ධීකාරක, බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව , පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය යන ලිපිනයට එවිය යුතු වේ.**

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2018.07.31 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ ඉහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, කවරයේ වම් කෙළවරේ **"බෞද්ධ අධයයන ඩිප්ලෝමා පාඨමාලාව - 2018 "** යනුවෙන් සඳහන් කළ යුතුය. අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කරුණාවෙන් සළකන්න.

**විමසීම්**
0112 914492 / 0718 588344